උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

மீயுயர் நீதிமன்றங்களின் கட்டிடத் தொகுதி முகாமை சபை

SUPERIOR COURTS COMPLEX BOARD OF MANAGEMENT



2022

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

CONTENT

			Page No.
1.	Introduction of the Board	Sinhala	01
2.	Board Appointed Sub Committees		02-03
3.	Our Envisioned Future		
	*Vision, Mission and Objective		04
4.	Changers in Human Resources for 2022		05
	*Appointments, Promotions and Resignation for the SCCBM Staff 2022		
5.	Appreciation from the Chief Executive Officer		06
6.	Financial Statements – 2022		
	❖ Overview of the year of 2022		07-08
	❖ Independent Audit Report		09-19
	Progress of Audit Report for the year 2022		20-23
	Audited Financial Statements		24-52
	- Statement of Financial Position		
	- Statement of Income & Expenditure		
	- Notes to the Financial Statements		
	- Statement of Cash Flow		
	- Statement of changes in Equity		
	- SCCBM Activities for the year of 2022		53-54
	- Funds Availability December 2022		55-56
	- Graph For Expenditure of 2022		57
	- Training and Capacity Development 2022		58
7.	Financial Statements - 2022	Tamil	
	Introduction of the Board		
	Our Envisioned Future		
	❖ Vision, Mission and Objectives		
	Changers in Human Resources for 2022		
	❖ Appointments, Promotions and Resignation for the SCCBM Staff 2022		59-104
	- Appreciation from the Chief Executive Officer		
	- Audited Financial Statements		
	- Statement of Financial Position		
	- Statement of Income & Expenditure		
	- Notes to the Financial Statements		
	- Statement of Cash Flow		
	- Statement of changes in Equity		
	- SCCBM Activities for the year of 2022		105
	- Funds Availability December 2022		106-108
	- Graph for Expenditure of 2022		109
	- Training and Capacity Development 2022		110
8.	Financial Statements – 2022	English	
	Introduction of the Board		111
	Board Appointed Sub Committees		112
	Changers in Human Resources for 2022		113
	❖ Vision, Mission and Objectives		114
	Appointments, Promotions and Resignation for the SCCBM Staff 2022		115
	❖ Appreciation from the Chief Executive Officer–		116
	❖ Independent Audit Report		
	❖ Overview of the year of 2022		120-152
	- Statement of Financial Position English		
	- Statement of Income & Expenditure		
	- Notes to the Financial Statements		
	- Statement of Cash Flow		
	- Statement of changes in Equity		
	- SCCBM Activities for the year of 2022		153-154
	- Fund Availability Statement December 2022		155-157
	- Graph of distribution expenditure for 2022		158
	- Training and Capacity Development 2022		159
	- Graph of type of received other Income for 2022		160

CM 38616 - 30 (2023/08) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

2022 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කළමනාකරණ මණ්ඩලයේ තිස් පස් වන (35)වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කර සිටිනු ලැබේ.

හැඳින්වීම

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලිවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එයට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා වැඩි දියුණුකිරීම් ඇතුලු ඒවා පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම අරමුණු කර ගනිමින් 1987 අංක 50 දරන පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත.

පනතේ 3(1) වගන්තියට අනුව කළමනාකරණ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ: -

(I) ගරු අග්‍ර විනිශ්චයකාර තුමා

(II) ගරු අග්‍ර විනිශ්චයකාර තුමා විසින් පත්කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්

(III) අභියාචනාධිකරණයේ සභාපති තුමා

(IV) අභියාචනාධිකරණයේ සභාපති තුමා විසින් පත්කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්

(V) අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා

(VI) රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා

(VII) ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපතිවරයා

(VIII) කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා

(IX) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක්

(X) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්

<u>උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටු -2022</u>

(1) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

(i) ඩබ්ලිව්.ඩී.එල්.පී. වික්‍රමසිංහ මහතා - සභාපති
(ii) එස්.එම්.යූ.එස්. සමරකෝන් මහතා - සාමාජික
(iii) ටී.ටී.එන්. ප්‍රනාන්දු මහත්මිය - සාමාජික
(iv) කේ.ඒ.ඩී.යූ. පීරිස් මහත්මිය - ලේකම්
(v) ඒ.එම්.සී. දිල්රුක්ෂි සිල්වා මහත්මිය - විකල්ප සාමාජික

(2) සුළු ප්‍රසම්පාදන කමිටුව

(i) ඩබ්ලිව්.ඩී.එල්.පී.වික්‍රමසිංහ මහතා - සභාපති
(ii) ටී. සජීවන් මහතා - සාමාජික
(iii) කේ. හපුආරච්චි මහත්මිය - සාමාජික
(iv) ඊ.ඩී.එල්.ප්‍රේමජිත් මහතා - ලේකම්
(v) තිලක් වේරගම මහතා - විකල්ප සාමාජික
(vi) අයි.යූ.කොඩිතුවක්කු මහත්මිය - විකල්ප සාමාජික

(3) තාක්ෂණික ඇගයීම් කමිටුව

(i) තිලක් වේරගම මහතා - සභාපති
(ii) එච්.ඩබ්ලිව්.අනුර මහතා - සාමාජික
(iii) අයි.පී.එල්.සචින්ත මහතා - සාමාජික
(iv) අයි.එම්.ඉන්සාෆ් මහතා - සාමාජික
(v) අයි .යූ.කොඩිතුවක්කු මහත්මිය - සාමාජික

(4) ලංසු විවෘත කිරීමේ කමිටුව

(i) එස්.වී.කේ.ද සිල්වා මෙනවිය - සාමාජික
(ii) අයි .යූ.කොඩිතුවක්කු මහත්මිය - සාමාජික
(iii) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර - සාමාජික
ලංසු ගොනුව අදාළ අංශයේ

<u>කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම සහ පත් කිරීම -2022 වර්ෂය</u>

2022-01-20 මුදල් අමාත්‍යාංශයේ, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඒ. වී. ජනාදර මහතා වෙනුවට, මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තුමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ඒ. කේ. කේ. ඩී. අරන්දර මහතා කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කරන ලදී.

2022-05-30 අධිකරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම් එම්. එම්. පී. කේ. මායාදුන්නේ මහතා වෙනුවට, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නව ලේකම් වසන්තා පෙරේරා මහත්මිය කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කරන ලදි.

2022-06-02 නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී. ඒ. අයි. සිරිනිමල් පෙරේරා මහතා වෙනුවට නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ නව ලේකම් ප්‍රදීප් රත්නායක මහතා කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පතකරන ලදී.

2022-06-30 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් රෝෂනී දිසානායක මහත්මිය 2020.06.30 දින සිට 2022.06.30 දක්වා කාලය තුළ කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස සේවය කරන ලද අතර, ඇයගේ දර්ශනපති උපාධිය සඳහා මෙරටින් බැහැර වී ඇත.

2022-11-22 නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ හිටපු ලේකම් ප්‍රදීප් රත්නායක මහතා වෙනුවට නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ නව ලේකම් ඩබ්ලිව්. එස්. සත්‍යානන්ද මහතා කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කරන ලදී.

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය



දැක්ම ප්‍රකාශය

කළමනාකරණ මණ්ඩලයේ දර්ශනය වනුයේ ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම කළමනාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීමය.

මෙහෙවර ප්‍රකාශය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මෙහෙවර වනුයේ පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම මගින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චය කාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළු සියලු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායි අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජනහිතකාමී පරිසරයක් සැකසීම තුළින් දර්ශනය සාක්ෂාත් කර ගැනීම වේ.

පරමාර්ථ ප්‍රකාශය

උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ද සංකීර්ණයේ සහ එහි ගොඩනැගිලි වල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම ද මණ්ඩලයේ පරමාර්ථ වන්නේය.

කාර්ය මණ්ඩල පත්වීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැනීම් ඉල්ලා අස්වීම් - 2022 වර්ෂය

අනුක්‍රමික අංකය	තනතුර	පත්වීම	උසස්වීම්	විශ්‍රාම ගැනීම්	ඉල්ලා අස්වීම්	සේවය හැර යාම්
1	අභ්‍යන්තර විගණන නිලධාරි - II වන ශ්‍රේණිය	01	-	-	-	
2	නඩත්තු නිලධාරි (විදුලි) - කොන්ත්‍රාත් II වන ශ්‍රේණිය	-	-	01	-	
3	කළමනාකාර සහකාර I වන ශ්‍රේණිය	-	-	-	01	
	II වන ශ්‍රේණිය	-	01	01	-	
	III වන ශ්‍රේණිය	-	-	-	-	
4	ආරක්ෂක සහයක I වන ශ්‍රේණිය	-	-	04	01	
	II වන ශ්‍රේණිය	-	-	-	-	
	III වන ශ්‍රේණිය	-	-	-	03	
5	තාක්ෂණික නිලධාරි (ඉලෙක්ට්‍රොනික හා විදුලි) II වන ශ්‍රේණිය	-	01	-	-	
	III වන ශ්‍රේණිය	-	-	-	03	
6	නඩත්තු සහයක II වන ශ්‍රේණිය	-	01	-	-	01
	III වන ශ්‍රේණිය	-	-	-	01	
7	කාර්යාල සහයක I වන ශ්‍රේණිය	-	-	01	-	

ඇගයීම

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පහත සඳහන් පාර්ශව විසින් එයට ලබා දෙන සහය සහ සහයෝගීතාවය අගය කරනු ලැබේ.

- අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
- භාණ්ඩාගාර ලේකම්වරයා සහ මුදල් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ කාර්ය මණ්ඩලය
- අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ කාර්ය මණ්ඩලය
- නාගරික සංවර්ධන අධිකාරිය
- රජයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව
- MOH (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි) සහ C.M.C. කාර්ය මණ්ඩලය
- ශ්‍රී ලංකා රතු කුරුස සංගමය
- නාගරික කොමසාරිස්,කොළඹ මහ නගර සභාව
- ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපතිවරයා සහ අනෙකුත් නිලධාරින් සහ කාර්යාල කාර්ය මණ්ඩලය
- උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්

මේජර් ජනරාල් ඩබ්ලිව්.ඩී.එල්.පී.වික්‍රමසිංහ (විශ්‍රාමික)
ප්‍රධාන විධායක නිලධාරි (මාර්ෂල්)
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

සමාලෝචිත කාල සීමාව තුළ ක්‍රියාකාරකම් - 2022 වර්ෂය

උපරිමාධිකරණ සංකීර්ණයේ සාමාන්‍ය පාලන කටයුතු,පරිපාලනය,කළමනාකරණය සහ නඩත්තුව කිරීම් වලට අමතරව,2022 වර්ෂයේ දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

1. ප්‍රාග්ධන වත්කම යටතේ ගොඩනැගිලි සහ ව්‍යුහයන්

- ලේඛන ගබඩා ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම සහ නවීකරණය
- විනිසුරු නිල නිවාසයේ වහලේ ජල කාන්දුවීම් සහ වැහිපිලි අලුත්වැඩියා කිරීම සහ නවිකරණය
- අමතර කටයුතු

2. ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම

(i) කාර්යාල ලිඛඩු සහ සවිකිරීම් මිලදී ගැනීම

- කාමර අංක 07 හි අධිකරණය සඳහා තේක්ක විත්තිකූඩුවක් මිලදී ගැනීම

(ii) කාර්යාල උපකරණ මිලදී ගැනීම

- ඉංජිනේරු සහ ආරක්ෂක අංශ සඳහා ඡායා පිටපත් යන්ත්‍ර 02ක් මිලදී ගැනීම
- විධායක පුටු 02ක් සහ පරිගණක පුටු 02ක් මිලදී ගැනීම
- සිදුරු විදිනයක් මිලදී ගැනීම
- ගබඩා සඳහා දෙපැති ඉණිමගක් මිලදී ගැනීම
- වානේ කබඩ් 02ක් මිලදී ගැනීම
- පරිගණක මේසයක් මිලදී ගැනීම
- මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම
- ලේසර් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම
- අඟුලු දැමිය හැකි වානේ කබඩ් 02ක් මිලදී ගැනීම
- LED රූපවාහිනී යන්ත්‍ර 02ක් මිලදී ගැනීම
- අංක 502, 503, 403, සහ 404 අධිකරණ කාමර සඳහා UPS යන්ත්‍ර 04 ක් මිලදී ගැනීම
- කාස්ටර් රෝද සහිත වානේ කුෂන් පුටු 05ක් මිලදී ගැනීම
- ගොනු රැඳවීමේ කැබිනට් 04ක් සහ ලාච්චුවක් මිලදී ගැනීම
- ආරක්ෂිත සේප්පු 02ක් මිලදී ගැනීම
- පරිගණකයක් මිලදී ගැනීම

(iii) මෙවලම් සහ උපකරණ

- ඉංජිනේරු අංශය සඳහා අතේ ගෙන යා හැකි විදුලි ඩ්‍රිල් එකක් මිලදී ගැනීම
- ඉංජිනේරු අංශය සඳහා රැහැන් රහිත විදුලි ඩ්‍රිල් එකක් මිලදී ගැනීම
- ඉංජිනේරු අංශය සඳහා ඩිජිටල් සහ ඇනලොග් බහුමාපක 02 ක් මිලදී ගැනීම
- උපරිමාධිකරණ සංකීර්ණයේ ගෙවත්ත සඳහා තණකොල කපන යන්ත්‍රයක් මිලදී ගැනීම

(iv) යන්ත්‍ර සහ පිරියත සවිකිරීම් මිලදී ගැනීම

- CCTV කැමරා 02 ක් සැපයීම සහ ස්ථාපනය
- 4 වන මහලේ විනිසුරු නිල මැදිරි සඳහා වායු සමීකරණ රැඳවුම් 07ක් මිලදී ගැනීම

3.මානව සම්පත් සංවර්ධනය

- මූලික ගබඩා කළමනාකරණ පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- රියදුරන් සහ සුළු සේවක කාර්ය මණ්ඩලය සඳහා විනය පිළිබඳ පුහුණුව
- ඇප සුරැකුම් ඇගයීම සහ වාර්තාකරණය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- රජයේ වාහන නඩත්තු කිරීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- මූල්‍ය රෙගුලාසි අංක 104 යටතේ හානි සහ පාඩු පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- ආයතන සංග්‍රහය සහ මූල්‍ය රෙගුලාසි පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- තොග සත්‍යාපනය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව
- විදුලි ජනන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ වැළැක්වීමේ නඩත්තුව පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව

2022 වසර සඳහා රජයේ ප්‍රදානයන්

* මහ භාණ්ඩාගාරය විසින් 2022 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් (1503-01-01-01-228) රුපියල් **112,370,000.00** ක අග්‍රිමයක් ලබා දී ඇත.
* මහ භාණ්ඩාගාරය විසින් 2022 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් (228-01-01-01-1509) රුපියල් **50,950,000.00**ක අග්‍රිමයක් ලබා දී ඇත.
* මහ භාණ්ඩාගාරය විසින් 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් (228-01-01-01-2201) වෙනුවෙන් රුපියල් **13,600,000.00**ක අග්‍රිමයක් ලබා දී ඇත.

විස්තරය	**භාණ්ඩාගාර ඇස්තමේන්තු 2022 වර්ෂය**	**භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම 2022 වර්ෂය**
පුනරාවර්තන වියදම් 1503-01-01-01-228	රු.113,680,000.00	රු.112,370,000.00
පුනරාවර්තන වියදම් - 228-01-01-01-1509	රු.55,465,000.00	රු.50,950.000.00
ප්‍රාග්ධන වියදම් - 2201-01-01-01-2201	රු.20,000,000.00	රු.13,600,000.00

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/B/SCCBM/FA/2022/04

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 26 දින

SUPERIOR COURTS COMPLEX
BOARD OF MANAGEMENT
31 MAY 2023

31 MAY 2023

මාර්ෂල්

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්: 01. ලේකම්, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

02. ලේකම්, අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

① Mgt FINANCE
- As discussed, pl prepare the replies and the document for the Annual Report.
31/05/2023

② I/Auditor

② Sec & the M
- Copy & next BOM.
31/05/2023

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/SCCBM/FA /2022/04

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 26 දින

මාර්ෂල්,

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

(ඒ) මණ්ඩලය විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ආකෘතිය භාවිතා කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්ෂය වී අවසන් නමුත් තවදුරටත් භාවිතයට ගනු ලබන රු.6,603,245 ක් වටිනා විදුලි සෝපානය සහ රු.851,711 ක් වටිනා ගිලන්රථයක් සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම ප්‍රමිතියෙහි 49 ඡේදය ප්‍රකාරව අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් මෝටර් වාහන තුල ඇතුලත් ඉහත ගිලන් රථය ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද එහි මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය වන රු. 12,500,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් ආයෝජන ක්‍රියාකාරකම් එම වටිනාකමින් අඩු වී තිබුණු අතර ප්‍රත්‍යාගණන අතිරික්තයට සමාන ප්‍රමාණයක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ ඌණතාවයට ගැලපීම හේතුවෙන් එම වටිනාකමින් මෙහෙයුම් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 25 සහ 55 ඡේදයන්ට පටහැනිවීම් හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට පටහැනිවීම් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.119,200,000 ක මෝටර් රථ සහ ගොඩනැගිලි ක්ෂය ප්‍රත්‍යාගණන සංචිත ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑම් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් එම වටිනාකමින් ආයෝජන ක්‍රියාකාරකම් අඩු වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ විලම්භීත අයභාරය ලෙස රු.132,560,770 ක් හඳුනාගෙන තිබුනමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ රු.13,360,770 ක් ලෙස ඌනතාවයට ගැලපීම් හේතුවෙන් රු.119,200,000 කින් මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 44 වන ඡේදය ප්‍රකාරව රජය විසින් සිදු කරනු ලබන ප්‍රදානයන් වත්කම් සහ අයභාර ලෙස හඳුනාගත යුතු වුව ද රු.13,600,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් මෙම ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හඳුනා ගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 වන ඡේදය ප්‍රකාරව පෙර වර්ෂ වලදී සිදු වූ වැරදි අතීතානුයෝගීව ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය යමහ ඉදිරිපත් කරන සංසන්දනාත්මක තොරතුරුවල නිවැරදි කල යුතු නමුත්, මණ්ඩලය විසින් එසේ සිදු නොකර රු.522,420 ක් පෙර වර්ෂයේ වැරදි සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි සමුච්චිත ආදායම් හා වියදම් ගිණුමට ගලපා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රමිති අංක 03 හි 54 වන ඡේදය ප්‍රකාරව හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. තවද, 2021 හා 2022 වර්ෂවලට අදාළ රු.204,990 ක ඇස්තමේන්තු වෙනස්වීම් සහ රඳවාගත් මුදල් කපා හැරීම් පෙර වර්ෂයන්ගේ වැරදි ලෙස හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි ගලපා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 15 හි 14 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් එහි අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් හෝ වෙන් වූ මූල්‍ය ප්‍රකාශනයක් ලෙස හෝ ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛන තීරු ලෙස ඉදිරිපත් කළ යුතු නමුත් මණ්ඩලය එසේ පිළියෙල කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) වන ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනෙන් මාස 12 ක් තුල නිරවුල් කිරීමට නියමිත වගකීම් ජංගම වගකීම් ලෙස හඳුනා ගනු ලැබිය යුතු වුවද මණ්ඩලය විසින් පාරිතෝෂික වෙන්කිරීම් වලට අදාල සමස්ත වටිනාකම වන රු.43,766,240 ක් ජංගම වගකීම් යටතේ හඳුනාගෙන තිබුණි. ඒ අනුව මණ්ඩලය පාරිතෝෂික වෙන් කිරීම් ජංගම සහ ජංගම නොවන වගකීම් ලෙස වෙන්කර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 50 වන ඡේදය ප්‍රකාරව එකම ස්වභාවයේ සහ එකම භාවිතයෙන් යුත් දේපළ පිරියත හා උපකරණ එකිනෙකට වෙනස් වූ පන්තීන් යටතේ වර්ගීකරණය කර දැක්විය යුතු වුව ද එසේ සිදු කර නොතිබුණි. තවද රු.22,214,601ක් වූ කාර්යාල උපකරණ වටිනාකම් තුල ඇතුලත් පරිගණක උපාංගවල වටිනාකම ගණනය කල නොහැකි වූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20 හි 17 ඡේදය අනුව පරිගණක මෘදුකාංග අස්පෘෂ වත්කම් ලෙස දැක්වීම වෙනුවට වටිනාකම රු.284,400 ක් වූ එම වත්කම දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(එ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වන කාරක ප්‍රාග්ධන වෙනස්වීම් හි සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලැබිය යුතු දැ හි වෙනස් වීම රු.4,312,326 ක මුදල් ගලා ඒමක් වුවද, එය රු.3,173,346 ක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු.1,138,980 ක වටිනාකමින් මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි.

(ඒ) 2010 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි සහ සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවලට අදාල වාර්ෂික ක්ෂය වටිනාකම් වන රු.119,200,000ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත්කිරීමට කටයුතු කර තිබුණි.

(ඔ) ගොඩනැගිලි පුනරුත්ථාපනය වෙනුවෙන් වැය කළ රු.6,232,227 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එකතු කිරීම් ලෙස හඳුනාගැනීම හේතුවෙන් වත්කම් එම වටිනාකම්න් අයි තක්සේරු වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් රු.311,611ක් ක්ෂය ලෙස හඳුනා ගෙන තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.5,920,616 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) අධිකරණ අමාත්‍යාංශයට අයත්ව තිබූ ඩබල් කැබ් රථයක් 2022 මාර්තු 14 දින සිට උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මාර්ෂල් කාර්යාලය වෙත පවරා දී තිබුණු අතර එය 2022 අගෝස්තු 22 දින තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.9,000,000 කට තක්සේරු කර තිබුණි. එම තක්සේරු වටිනාකම ආදායම් වියදම් ප්‍රකාශයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ප්‍රත්‍යාගණන සංචිත අරමුදල් ගිණුමට බැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිත අරමුදල එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන පාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම් උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ

විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති 1.2.1(ආ) යන නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයටයොමුව		නිරීක්ෂණ
(අ)	1982 අංක 43 දරන මුද්දර බදු පනතේ විධිවිධාන හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය	රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත්, අවස්ථා 03 කදී රු.222,200ක ගෙවීම් වෙනුවෙන් මුද්දර ගාස්තු අයකර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	i. මුදල් රෙගුලාසි 104 (3) (4)	සමාලෝචිත වර්ෂය තුල සිදු වූ වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) (4) පරිදි කටයුතු කර නොතිබුණි.
	ii.මුදල් රෙගුලාසි 880	ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය)	
	i. ඡේද අංක 2.3 හි උපලේඛන I	චක්‍රලේඛය පරිදි උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.
	ii. ඡේද අංක 2.3 හි උපලේඛන I හි 2	ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු උපායමාර්ග, නිශ්චිත ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම් සිදු කිරීමේ වගකීමට බැඳෙන පුද්ගලයින් සහ අපේක්ෂිත මූල්‍ය ඇස්තමේන්තු සඳහා කාල රාමුවක් සහිතව අදාළ නිලධාරීන් නිශ්චිතව සඳහන් කර නොතිබුණි.

iii. ඡේද අංක 2.3 හි උපලේඛන I හි 3 — ප්‍රධාන අයවැය ලේඛනයට ඇතුළත් විය යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, පුරෝකථනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවරයන් දක්වමින් ප්‍රසම්පාදන කාල සටහනක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වූවද සමාලෝචිත වර්ෂයේ සිදු කල රු.10,696,664 ක ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) මණ්ඩලයෙහි අනුමත කාර්ය මණ්ඩලය 180 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට තනතුරු 08 ක සේවකයින් 40 ක ඌනතාවයක් පැවතුණි. ඒ අනුව මණ්ඩලයෙහි කාර්යමණ්ඩලය වර්තමාන තත්ත්වයට අනුව සකස් කර ගැනීමට හෝ අනුමත තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලක්දිව ඉංජිනියරින් පුද්ගලික ආයතනය විසින් 2022 ජනවාරි 10 දින රු.690,091 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර 2022 මාර්තු 03 දිනැති ලිපිය මඟින් ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2022 ජූලි 04 දින උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් ලක්දිව ඉංජිනියරින් ආයතනයට යවා ඇති ලිපිය අනුව එම අළුත්වැඩියාව රු.910,417 ක වටිනාකමකට ලබා දී තිබුණි. 2022 මැයි 05 දින අදාල සේවා ආයතනය විසින් රු.910,417 ක මිල ගණන් ඉදිරිපත් කර තිබූ බව සඳහන් වූවද එම මිල ගණන් සහිත ලිපිය විගණනයට ඉදිරිපත් කළ ලිපි ගොනුවේ ඇතුලත් නොවූ අතර එම රු.910,417 ක වටිනාකමට අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි. කළමනාකරණ මණ්ඩලය විසින් මෙම අලුත්වැඩියා කටයුත්ත සිදු කිරීම ප්‍රමාද වීම නිසා මුළු වියදම ද රු. 220,326 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති එකතුව රු.2,634,213 ක ණයගැති ශේෂයන්ගෙන්, දින 30 ඉක්මවා ඇති ශේෂය රු.1,489,556 ක් විය. එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 57 ක් වූ අතර මෙම ශේෂය තුළ ඇතුළත් වර්ෂ 03 ඉක්ම වූ රු.215,799ක ණය ගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ආරක්ෂක හා ඉංජිනේරු අංශ සේවකයින් සඳහා බාහිර පාර්ශවයකින් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක් සඳහා අදාල කුලී ගිවිසුම 2022 අගෝස්තු 04 දින අවලංගු කර තිබුණු අතර ගිවිසුමට ඇතුල්වීමේ දී ගොඩනැගිලි හිමිකරු වෙත තැන්පත් කරන ලද මාස 03 ක කුලී තැන්පත් මුදල වන රු. 1,350,000 ක මුදල 2023 මාර්තු 20 දින වන විටත් අයකර ගෙන නොතිබුණි

(ඉ) 2022 වර්ෂයේ අයවැය අනුව අයවැයගත ආදායම රු.22,055,000 ක් වුවද, තථ්‍ය ආදායම රු.16,948,589 ක් වූයෙන් රු.5,106,411 ක වෙනසක් නිරීක්ෂණය විය. අයවැයගත ආදායමට වඩා තථ්‍ය ආදායම සියයට 23 කින් පහල ගොස් ඇති අතර අපේක්ෂිත ඉලක්කය කරා ලඟා වීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඊ) 2022 වර්ෂයේදී දරන ලද පුනරාවර්තන වියදම් අතුරින් වියදම් වර්ග 06 ක් සඳහා අයවැය ගත වියදම රු.115,878,000ක් වුවද තථ්‍ය වියදම රු.129,722,866 ක් වූයෙන් අයවැය ගත වියදම ඉක්මවා රු.13,844,866 ක් වැය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
மீயுயர் நீதிமன்றக் கட்டிடத் தொகுதியின் முகாமைச் சபை
SUPERIOR COURTS COMPLEX BOARD OF MANAGEMENT

මාර්ශල් කාර්යාලය,
උපරිමාධිකරණ සංකීර්ණය,
තැ.පෙ. 223, අල්ෆ්ස්ඩේ,
කොළඹ 12.

மார்ஷல் அலுவலகம்,
மீயுயர் நீதிமன்றுக் கட்டிடத் தொகுதி,
அ.பெ. 223, புகுக்கடை,
கொழும்பு 12.

OFFICE OF THE MARSHAL,
SUPERIOR COURTS COMPLEX,
P. O. BOX 223, HULFTSDORP STREET,
COLOMBO 12.

Finance Division
21 JUN 2023

SCCBM/IA/15/03/2022 2023.06.21

විගණන අධිකාරිතුමිය
රජයේ විගණන අංශය,
අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 10.

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ
2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව

යොමුව - ඔබගේ අංක JLO/B/SCCBM/FA/2022/04 දරන 2023.05.26 දිනැති වාර්තාව

යොමු ලිපියෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ සඳහා අපගේ පැහැදිලි කිරීම් හා ගනු ලැබීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග පහත පරිදි ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

1.2.තක්වාගණනය කළ මතය සඳහා පදනම

අ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 01 හි සඳහන් ආකෘතිය අනුව 2023 වර්ෂයේ සිට මූල්‍ය තක්ත්ව ප්‍රකාශනය පිලියෙල කරන බව දන්වා සිටිමි.දැනට ඉදිරිපත් කර ඇති ආකෘතියේ ද ඇතුලත් විය යුතු සියළුම කරුණු ඇතුළත් වන නමුත් ඉදිරිපත් කර ඇති පිළිවෙල පමණක් වෙනස් වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ආ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් රු.6,603,245 ක් වටිනා 2008 වර්ෂයට පෙර මිලදී ගෙන ඇති විදුලි සෝපාන වැඩිදියුණු කිරීම් ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමට මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය අනුව නම් කරන ලද වත්කම් තක්සේරු කිරීමේ කමිටුව වෙත භාරදී ඇත. එම වත්කමේ ප්‍රත්‍යාගණනය වටිනාකම 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

නවද 1990 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.851,711 ක් වටිනා අංක 39-0592 දරන ගිලන් රථයේ පිරිවැය ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුනි. 2022.12.31 දින වන විට එම ගිලන් රථය අවප්‍රයෝජනය කිරීම සඳහා ගරාජයේ තිබූ බැවින් 2022 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදු නොකෙරුනු අතර එය අවප්‍රයෝජනය කර ලද විගස තක්සේරු කටයුතු සඳහා යොමු කර 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

එසේම ඉදිරියට ප්‍රත්‍යාගණන අතිරික්තයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් නොකරන බවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අතිරික්තයට/ඌණතාවයට ගැලපීම් නොකරන බවත් දන්වා සිටිමි.

ඇ) මෙම ක්ෂය වටිනාකම් ඉදිරියට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනා නොගන්නා බවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ හඳුනාගන්නා බවත් දන්වා සිටිමි.

ඈ) 2022 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයෙන් උපරිමාධිකරණ සංකීර්ණය වෙත ලැබුනු රු.13,600,000 ක ප්‍රාග්ධන ලැබීම්, රජයේ ප්‍රාග්ධන ලැබීම් (Government Capital) ලෙස හඳුනාගෙන හිමිකම් (Equity) යටතේ ගිණුම් ගත කර ඇත. ඉදිරියට SLPSAS 11 හි ඡේද 44ට අනුකූලව ප්‍රාග්ධන ලැබීම් වත්කම් හා අයභාර ලෙස වෙන් ව හඳුනාගෙන ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.

දුරකතන தொலைபேசி Telephone | பொது பொது General 011 2437507 - 17, 011 2329044 | ෆැක්ස් தொலைநகல் Fax 011 2437530 | මාර්ශල් மார்ஷல் Marshal 011 2437500 | ඊ. තැපෑල மி. அஞ்சல் E-mail marshalsecbnew@slt.net.lk

Mgr. Engineering Svcs. T.P.: 011 2437502 Fax: 011 2437522 | Mgr. Security T.P.: 011 2437504 | Mgr. Admin. & H.R. T.P.: 011 2437501 | Mgr. Finance T.P.: 011 2437503 | Housekeeping Officer T.P.: 011 2437505 | Procurement Officer T.P./Fax: 011 2437518 | Internal Audit Officer T.P.: 011 2437559

ඉ) ඉදිරියට ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 වන ඡේදයට අනුව පෙර වර්ෂවලට අදාල වැරදි නිවැරදිව ගැලපීම සිදු කරන බවත් ඡේද අංක 54 අනුව එම හෙලිදරව් කිරීම් සිදු කරන බවත් දැනුම් දෙමි.

ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 15 හි 14 වන ඡේදය ප්‍රකාරව 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල අයවැය හා සත්‍ය ශේෂ අතර සංසන්දනාත්මක ඉදිරිපත්කිරීමක් සිදු කරන බව දන්වා සිටිමු.

උ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) වන ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් ඡංගම සහ ඡංගම නොවන වශයෙන් වෙන්කර දැක්වීමට 2023 වර්ෂයේ සිට කටයුතු කරන බව දන්වා සිටිමු.

ඌ) උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ස්ථාවර වත්කම් වර්ගීකරණයේ දී කාර්යාල ගෘහ භාණ්ඩ සවිකිරීම්, කාර්යාල උපකරණ හා සවිකෘත හා සවිකිරීම යන වත්කම් කාණ්ඩ 03 ම එකම වත්කම් පන්තියකට හා පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙසද 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කරන බව දන්වා සිටිමි.

එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව හා මෙම නිරීක්ෂණය පදනම් කරගෙන ඉදිරියේදී මුදල් ප්‍රවාහය නිවැරදිව ගැලපීම සිදු කරන බව දැනුම් දෙමි.

ඒ) ඉදිරියට ප්‍රත්‍යාගණිත වත්කමක ක්ෂය වටිනාකම විලම්බිත අයභාරයක් ලෙස හඳුනා ගැනීමේදී ප්‍රත්‍යාගණන සංචිතයට ගැලපීමට කටයුතු නොකරන බව දන්වා සිටිමි.

ඔ) ස්ථාවර වත්කම් යටතේ ඇති ගොඩනැගිලි ගිණුමේ 2022 වර්ෂයට අදාළව රු. 6,232,227 යනු වර්ෂයේ එම උපරිමාධිකරණ සංකීර්ණයට අයත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් වැය කල පිරිවැය වේ.

එම වැය කල පිරිවැය හේතුවෙන් එම ගොඩනැගිලි වල වටිනාකම් වැඩි වී තිබේ (Value Added) . එබැවින් එසේ සිදු කරන අලුත්වැඩියා කිරීම් වත්කමක් ලෙස හඳුනාගන්නා ලද අතර එම වියදම් සිදු කරන ලද්දේ භාණ්ඩාගාරයෙන් ලබාදෙන මුලධන වියදම් වලිනි.

ගොඩනැගිලි වල වටිනාකම වැඩි වීමක් සිදු වී ඇති බැවින්ද හා වර්ෂයකට වැඩි කාලයක් භාවිත කල හැකි බැවින් ද එම ගොඩනැගිලි අලුත්වැඩියා අගය ස්ථාවර වත්කම් යටතේ ඇති ගොඩනැගිලි ගිණුමේ එම වටිනාකම් ගිණුම්ගත කරනු ලැබේ. එසේ සිදු කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු පහත පරිදි වේ

- RR ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම.
- වීනිසුරුවරුන්ගේ මහල් නිවාසයේ වහල ජලය කාන්දු වීම සහ කාණු ප්‍රතිසංස්කරණය කිරීම
- JSD කන්ටේනරයේ අමතර වැඩ සිදු කිරීම.
- වීනිසුරුවරුන්ගේ මහල් නිවාසයේ වහලයේ ජලය කාන්දුවීමේ අමතර කාර්යයන් සිදු කිරීම.

ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 11 අනුව හා මෙම නිරීක්ෂණය පදනම් කරගෙන 2023 වර්ෂයේ ගිණුම් තුල නිවැරදිව ගැලපීම සිදු කරන බව දැනුම් දෙමි.

2.2.2 නීති රීති/ විධානයට යොමුව

අ) වවුචර අංක 011,110,116 සඳහා ගෙවීම් සිදුකර ඇත්තේ පෙර ගෙවීම් ලෙස වන අතර එහිදී පෙර ගෙවීම් ඉල්ලුම්කල අංශය විසින් වවුචර් අත්සන් කර චෙක්පත් ලබාගෙන අදාල සැපයුම්කරු වෙත භාරදී භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සිදු කර ඇත.

වර්තමානයේදී, සියලුම රු.25,000ට වැඩි වවුචර්පත් සඳහා රු.25/-ක මුද්දර මත අත්සන තබා හෝ අදාල ගාස්තුව අඩුකරගනිමින් ගෙවීම සිදු කෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි.

ආ)

i. මුදල් රෙගුලාසි 104 (3) (4)
අප ආයතනයේ GD 5068 හා CAE 2297 අංක දරන වාහනවල කොවිඩ් වසංගත කාලයේ සිදු වූ අනතුරු සම්බන්ධ පරීක්ෂණ කටයුතු හා අදාල වාර්තා මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල පරිච්ඡේදවලට අනුකූලව සිදු කිරීමට නොහැකි වී ඇත. නමුත් එම වාහන අනතුරු සම්බන්ධ කටයුතු ලේකම්තුමිය, අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන මේ වන විට අවසන් කොට ඇත. ඒ අනුව ඉදිරියේදී

වාහන අනතුරු සිදු වුවහොත් මුදල් රෙගුලාසි වලට අනුකූලව නියමිත කාලයන් තුල අදාල පරීක්ෂණ කටයුතු සිදු කරන බව දන්වමි.

ii. මුදල් රෙගුලාසි 880
අප ආයතනයේ මේ දක්වා ඇප ආඥා පනතට අනුව ඇප තැබීම සිදු කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු වලදීද මේ පිලිබඳ දිගින් දිගටම සාකච්ඡාවට ගැනෙන අතර ඉදිරියේදී එම තීන්දු තීරණ වලට අනුකූලව මේ පිලිබඳ අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි.

ඇ)

i. 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයේ ඡේද 2.3 හි උපලේඛන I ප්‍රකාරව වර්ෂ 05ක් සඳහා උපායමාර්ගික සැලැස්මක් අප ආයතනය විසින් පිළියෙල කර නැත. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය පිහිටුවීමේ අරමුණ වන්නේ උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම හා සංකීර්ණයේ සහ එහි ගොඩනැගිලි වල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම වේ. එම පරමාර්ථ ඉටුකිරීමේදී බොහෝ අවශ්‍යතා වසර 05ක් සඳහා කල්තියා පුරෝකථනය කිරීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීම හා ඊට අනුකූලව කටයුතු කිරීම අසිරු වේ.

තවද, උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල චීන සමූහාණ්ඩුවේ පරිත්‍යාගයක් වන බැවින් එහි නවීකරණ කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ චීන සමූහාණ්ඩුව විසින්ම සිදුකෙරෙන බව දන්වා සිටිමි.ඒ අනුව මෙම කාලසීමාව තුල එම නවීකරණ කටයුතු සිදුවෙමින් පවතී.

ii. 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයේ ඡේද 2.3 හි උපලේඛන I ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර පිලියෙල කල යුතු වුවද රේඛීය අමාත්‍යාංශයෙන් අපගේ ආයතනයට වෙන් කරන ලද ප්‍රතිපාදනය දන්වන ලද්දේ ද 2021.12.20 දිනදීය. එම ප්‍රතිපාදනයට අනුව 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2022.01.03 දින ලේකම් තුමා වෙත නිශ්චිත ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් සිදු කිරීමේ වගකීමට බැඳෙන පුද්ගලයින් සහ අපේක්ෂිත මුල්‍ය ඇස්තමේන්තු සඳහා කාලරාමුවක් සහිතව පිලියෙල කරන ලදී.

iii. මේ පිලිබඳව සොයා බලා චක්‍රලේඛය අනුව අයවැය ලේඛනය පිලියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි.

2.2.4 මේ වන විට එක් එක් ප්‍රසම්පාදන ක්‍රියා සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන කාල සටහන් පිලියෙල කර ඊට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් සිටී.

2.3 වෙනත් කරුණු

(ආ) අප ආයතනයේ අනුමත කාර්මණ්ඩලය 180ක් වන අතර මේ වන විට පුරප්පාඩු 40කට අධිකව පවතී. 2022 වර්ෂය පුරප්පාඩු වූ තනතුරු බදවා ගැනීමට මූලික කටයුතු අප ආයතන මට්ටමින් සිදු කළද ඒ සඳහා අදාල අනුමැතීන් රේඛීය අමාත්‍යාංශයෙන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් නොලැබිණි.ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් හුවමාරු වූ ලිපි හා චක්‍රලේඛවල පිටපත් 2023.04.04 දිනැතිව SCCBM/IA/09/03/2022 දරන යොමු ලිපියෙන් ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත පුරප්පාඩු වූ තනතුරු වලින්,
නඩත්තු නිලධාරී (විදුලි)-01
නඩත්තු නිලධාරී (වායුසමීකරණ,ජල සම්පාදන හා මෙහෙයුම්) -01
ප්‍රාථමික (ශිල්පීය) සේවා තනතුරු - 01ක්ද
ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා තනතුරු -03ක් සඳහාද මේ වන විට බදවා ගැනීම් සිදු කර ඇත.

තවද ආරක්ෂක සහකාර පුරප්පාඩු සඳහා බදවා ගැනීම් සිදු කෙරෙන තුරු වර්ෂයක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් 10 දෙනෙකුගේ සේවය 2023 මැයි මස සිට ලබා ගෙන ඇත.

සමස්තයක් ලෙස ගත් කල පුරප්පාඩු ඇති වූ විගස අප විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කරන අතර පවතින චක්‍රලේඛ හා ප්‍රතිපත්තිමය තීරණ මත බදවා ගැනීම් සම්බන්ධ කටයුතු ආයතන මට්ටමේ පාලනයෙන් බැහැරව පවතී.

(ආ) මෙම විගණන විමසුමට 2022.11.08 දිනැති SCCBM/IA/04/03/2022 දරන ලිපිය මගින් සවිස්තරාත්මක පිලිතුරක් ලබා දී ඇත. කෙසේ වුවද රු.220,326ක මිල ගණන් ඉහල යාම සිදුවී ඇත්තේ කාල පමාවක් මත නොව 2022 වර්ෂයේ රටේ පැවැති ආර්ථික අර්බුදය හමුවේ වාහන අමතර කොටස්වල මිල අධිකව ඉහල යාම නිසා බව ලක්දිව ඉංජිනේරු ආයතනයෙන් ලද 2022.09.13 දිනැති ලිපියේ ඇතුලත් කරුණු අනුව දන්වා සිටිමි.

(ඇ) ගිවිසුම්ගත වීම ප්‍රමාද වීම හේතුවෙන් හා අප ආයතනයේ ආරක්ෂක සේවාව ලබාගන්නා රාජ්‍ය ආයතනවලට භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ණයගැති ශේෂයන් අයවීමට කල් ගත්වූ බවත් මේ වන විට එම ණයගැති මුදල් අය වී ඇති බවත් දන්වා සිටිමි.

තවද විගණන නිරීක්ෂණයේ ඇතුලත් වර්ෂ 03 ඉක්මවූ ණය ගැති ශේෂය වන රු.215,799ක ශේෂය උ.සං.ක.ම හිටපු මූල්‍ය කළමණාකරු ගෙන් අයවීමට පවතින මුදලක් වන අතර මේ සඳහා නඩු කටයුත්තක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිසා අධිකරණයේ ගොනු කර ඇත.

(ඈ) උපරිමාධිකරණ සංකීර්ණයේ ආරක්ෂක හා ඉංජිනේරු අංශ සේවකයින් සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල වෙනුවෙන් උ.සං.ක.ම විසින් එහි හිමිකරු වෙත ලබාදුන් රු.මිලි.1.35 ක තැන්පතු මුදල ආපසු නොගෙවීම හේතුවෙන්; නීතිපති දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි හිමිකරුට එරෙහිව එන්තරවාසියක් යවා 2023.03.16 සිට දින 21ක කාලයක් එම මුදල ගෙවීමට ලබා දෙන ලදී.නමුත් ගොඩනැඟිලි හිමිකරු විසින් එම මුදල නොගෙවීම මත නීතිමය කටයුතු ඉදිරියට කෙරෙමින් පවතී.

(ඉ) 2022 වර්ෂයේ අයවැය අනුව අයවැයගත ආදායම රු 22,055,000 ක් අපේක්ෂා කලද සත්‍ය වශයෙන් 2022.12.31 දින වන විට ළඟා කර ගත හැකි ආදායම වූයේ රු 16,948,589 ක් පමණි. 211 ස්ථිර නිලුද්ගල මහාධිකරණයේ කුලී මුදල් ආදායම සත්‍ය අගයට වඩා වැඩි අගයකින් ප්‍රුරෝකථනය කර තිබීම මෙම වෙනසට හේතුව ලෙස හඳුනා ගන්නා ලදී.

(ඊ) උ.සං.ක.ම විසින් අවසන් ගිණුම් පිලියෙල කරන්නේ උපචිත පදනම මත වේ. මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන සඳහා පිලියෙල කල අයවැය ඇස්තමේන්තුවේ එම වර්ෂයට අදාළ මුදලින් ගෙවූ වියදම් පමණක් ඇතුලත් වේ. අයවැය ඇස්තමේන්තුව හා වර්ෂය තුල මුදලින් ගෙවන වියදම සංසන්දනය කිරීමේදී අයවැය ගත වියදමට වඩා සත්‍ය වියදම අඩු බව දන්වා සිටිමි.

වියදම් වර්ගය	අයවැයගත වියදම '000'	සත්‍ය වියදම '000'	වෙනස '000'	ඉකිරිය
සේවක වේතන	77,288	74,413	2,875	4%
ගෘහ පාලන වියදම්	9,571	9,571	-	-
ජෙනරේටර් ධාවන ගෑස්තු	616	616	-	-
තැපැල්	112	112	-	-
දුරකථන වියදම්	618	612	6	1%
විදුලි වියදම්	27,673	27,638	35	0.1%

මේජර් ජෙනරාල් ඩබ්ලිව්.ඩී.එල්.පී වික්‍රමසිංහ (විශ්‍රාමික)
ප්‍රධාන විධායක නිලධාරි/මාර්ෂල්
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

THE MARSHAL
SUPERIOR COURTS COMPLEX
BOARD OF MANAGEMENT
P.O. Box 1421, COLOMBO 12.
Tel: 0112 437507-17

4

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022		2021	
		රු.	රු.	රු.	රු.
වත්කම්:- ජංගම නොවන වත්කම්:-					
දේපල, පිරියන සහ උපකරණ	01	5,860,544,731	5,860,544,731	5,970,431,260	5,970,431,260
ජංගම නොවන වත්කම්:-					
උපයෝගීතා සහ අනෙකුත් සේවා වෙනුවෙන් කරන ලද තැන්පතු	3-අ	7,495,250		6,145,250	
ලැබිය යුතු අපදා ණය	3 -ආ-2	2,776,328		2,959,693	
			10,271,578		**9,104,943**
ජංගම වත්කම්:-					
තොග	02	8,816,544		7,219,591	
ලැබිය යුතු අපදා ණය	3 -ආ, 2	2,013,835		2,041,490	
ලැබිය යුතු - වෙළඳ සහ අනෙකුත්	3-ආ, ඇ	2,657,763		6,970,089	
කලින් ගෙවීම්	04	81,480		80,892	
මුදල් සහ මුදල් සමාන දෑ	05	14,486,082		9,419,462	
			28,055,704		**25,731,524**
මුළු වත්කම්			**5,898,872,013**		**6,005,267,727**
වගකීම්:-					
ප්‍රාග්ධන සහ සංචිත:-					
සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන	10	124,864,917		124,625,689	
සමුච්චිත ආදායම	11	(8,139,958)		(6,217,038)	
ප්‍රත්‍යාගණන සමුච්චිත අරමුදල	12	5,728,922,708		5,835,622,708	
			5,845,647,667		**5,954,031,360**
ජංගම වගකීම්:-					
ගෙවිය යුතු වෙළඳ සහ උපචිත	**6 -අ,ආ**	8,860,044		3,570,510	
අනෙකුත් ගෙවිය යුතු	**6 -ඇ,ඈ,ඉ**	44,364,302		47,665,857	
			53,224,346		**51,236,367**
මුළු වගකීම්			**5,898,872,013**		**6,005,267,727**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කරමු.

මේජර් ජනරාල් ඩබ්. ඩී. එල්. පී. වික්‍රමසිංහ (විශ්‍රාමික)
මාර්ෂල්
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

කේ. ඒ. ඩී. යූ. පිරිස්
මූල්‍ය කළමනාකරු
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය සතු වේ.
උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදි.

ගරු වී. කේ. මලල්ගොඩ, ජනාධිපති නීතීඥ
මණ්ඩල සමාජික
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු

සුගත් කල්දේරා මහතා
මණ්ඩල සමාජික
නීතීඥ

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් සහ වියදම් ප්‍රකාශය

	සටහන	2022	2021
		රු.	රු.
ආදායම:-			
රජයේ ප්‍රදාන-පුනරාවර්තන		163,320,000	162,641,000
අනෙකුත් මෙහෙයුම් වියදම්	07	16,948,589	16,736,693
විලම්භීත ආදායමට මාරුකල වටිනාකම	01	132,560,770	126,356,875
අඩුකලා - වියදම			
කාර්ය මණ්ඩල පිරිවැය	08	(103,506,950)	(104,698,979)
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම	01	(132,560,770)	(126,356,875)
අනෙකුත් මෙහෙයුම් වියදම්	09	(78,242,388)	(67,958,400)
වියදම ඉක්මවා ආදායමේ පවතින හිඟය/අතිරික්තය		(1,480,748)	6,720,314
වියදම ඉක්මවා පවතින ශුද්ධ පාඩුව/ලාභය		**(1,480,748)**	**6,720,314**

සටහන් අංක 01
දේපල, පිරියත සහ උපකරණ

ලෙජරය	2022.01.01 දිනට රු.	වර්ෂය තුල එකතුකිරීම් රු.	පූර්ව වර්ෂයට අදාළ ගැලපුම් රු.	වර්ෂය තුළ බැහැර කිරීම් රු.	2022.12.31 දිනට රු.
ඉඩම්	4,788,000,000	-	-	-	4,788,000,000
ගොඩනැගිලි	2,481,257,659	6,232,227	-	-	2,487,489,886
රථවාහන	2,781,711	12,500,000	-	1,930,000	13,351,711
කාර්යාල ලී බඩු සවිකිරීම්	18,387,374	155,904	-	4,354,519	14,188,759
කාර්යල උපකරණ	6,672,825	2,414,742	-	1,189,977	7,897,590
මෙවලම් සහ උපකරණ	367,635	81,474	-	175,666	273,443
ආරක්ෂක උපකරණ	669,949	-	-	66,373	603,576
සවිකිරීම් සහ උපාංග	300,074	-	-	171,822	128,252
පරිගණක මෘදුකාංග	284,000	-	-	-	284,000
ගෘහ පාලන උපකරණ	2,791,553	-	-	223,744	2,567,809
පිරියත සහ යන්ත්‍ර	119,507,083	1,812,317	-	51,265,404	70,053,996
සෝපානය නවීකරණය	6,603,245	-	-	-	6,603,245
පී.ඒ.බී.එක්ස්. පද්ධතිය	5,297,770	-	-	-	5,297,770
පී.ඒ. සහ පටිගතකිරීමේ පද්ධතිය	3,181,072		-	3,160,761	20,311
මානව සම්පත් සංවර්ධනය	522,420		(522,420)	-	-
	7,436,624,370	**23,196,664**	**(522,420)**	**62,538,266**	**7,396,760,348**

සමුච්චිත ක්ෂය	2022.01.01 දිනට රු.	වර්ෂය තුළ එකතුකිරීම් රු.	පූර්ව වර්ෂයට අදාළ ගැලපුම් රු.	වර්ෂය තුළ බැහැර කිරීම් රු.	2022.12.31 දිනට රු.
ගොඩනැගිලි	1,362,090,580	117,212,365	-	-	1,479,302,945
රථවාහන	2,781,708	3,125,000	-	1,930,000	3,976,708
කාර්යාල ලී බඩු සවිකිරීම්	6,679,188	1,773,594	-	4,354,519	4,098,263
කාර්යල උපකරණ	2,550,608	987,199	-	1,189,977	2,347,830
මෙවලම් සහ උපකරණ	199,608	68,360	-	175,666	92,302
ආරක්ෂක උපකරණ	435,574	150,894	-	66,373	520,095
සවිකිරීම් සහ උපාංග	520,870	16,031	-	171,822	365,079
පරිගණක මෘදුකාංග	189,333	94,666	-	-	284,000
ගෘහ පාලන උපකරණ	1,224,738	320,976	-	223,744	1,321,970
පිරියන සහ යන්ත්‍ර	74,547,849	8,756,749	-	51,265,404	32,039,194
සෝපානය නවීකරණය	6,603,245	-	-	-	6,603,245
පී.ඒ.බී.එක්ස්. පද්ධතිය	5,195,778	52,398	-	-	5,248,176
පී.ඒ. සහ පටිගතකිරීමේ පද්ධතිය	3,174,031	2,538	-	3,160,761	15,808
	1,466,193,109	**132,560,770**	-	**62,538,266**	**1,536,215,615**
ලියාහල අගය	**5,970,431,261**				**5,860,544,731**

විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති:

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

(1) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලැබේ.

(2) උද්ධමන සාධක සඳහා ගැළපීම් සිදු නොකෙරේ.

(3) වර්ෂය සඳහා ක්ෂයවීම්වලට සමාන මුදලක් සමුච්චිත ප්‍රාග්ධන ගිණුමෙන් ආදායම් සහ වියදම් ගිණුමට විලම්භීත ආදායම ලෙස මාරුකර ඇත.

තොග ඇගයීම

(4) තොග ඇගයීම අවම පිරිවැයට සහ අඩු මිලට සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමට සිදුකර ඇත.

ණයගැතියෝ

(5) ණයගැතියන් ඔවුන්ගේ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකමට ප්‍රකාශකර ඇති අතර බොල් සහ අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන සපයා නැත.

වගකීම් සහ ප්‍රතිපාදන

(6) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව විශ්‍රාම යන සේවකයන්ට ගෙවිය යුතු පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිපාදන සලසා ඇත. වගකීම බාහිර අරමුදල් මගින් පියවා නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

(7) සින්නක්කර ඉඩම්,පිරියත සහ උපකරණ හැර අනෙකුත් දේපළ ක්ෂයවීම් ශීර්ෂය යටතේ දක්වා ඇති පදනම මත සමුච්චිත ක්ෂයවීම් යටතේ සටහන් වේ. සින්නක්කර ඉඩම් තක්සේරු කිරීමේදී ගිණුම්වලට ඇතුළත් වේ.

ක්ෂයවීම්:

(8) ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සින්නක්කර ඉඩම් සහ මානව සම්පත් සංවර්ධනය හැර අනෙකුත් සියලුම දේපළ, කම්හල් සහ උපකරණවල පිරිවැය මත ගණනය කෙරේ. සම්පූර්ණ ප්‍රතිපාදන මිලදී ගැනීම සහ විකිණීම සිදුකළ වර්ෂය තුළ සිදු කෙරේ.

ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

ගිණුම්	අනුපාත
01. ගොඩනැගිලි	05.00%
02. මෝටර් රථ	25.00 %
03. යන්ත්‍ර සහ පිරියත	12.50 %
04. සවිකිරීම් සහ උපාංග	12.50 %
05. කාර්යාලයීය ගෘහභාණ්ඩ සහ උපාංග	12.50 %
06. කාර්යාල උපකරණ	12.50 %
07. මෙවලම් සහ උපකරණ	25.00 %
08. ආරක්ෂක උපකරණ	25.00 %
09. ගෘහ පාලන උපකරණ	12.50 %
10. පරිගණක මෘදුකාංග	33 1/3 %
11. P. A. B. X. පද්ධතිය	12.50 %
12. P. A. B. X. පටිගත කිරීමේ පද්ධතිය	12.50 %
13. විදුලි සෝපානය නවීකරණය	12.50 %

සටහන් අංක 02
තොග
2022 දෙසැම්බර් 31 දිනට තොග

සංකේත අංකය	විස්තරය	2022 වර්ෂය	2021 වර්ෂය
A 0001-0177	වායු සමීකරණ අමතර කොටස්	1,558,645	1,768,530
B 3751-3796	පිත්තල සහ යකඩ සවිකිරීම්	111,622	144,238
C 6001-6114	පී.ඒ. පද්ධති (සන්නිවේදන) අමතර කොටස්	47,928	47,934
C 7001-7075	දුරකථන උපාංග(සන්නිවේදන) අමතර කොටස්	319,834	290,106
E 2001-2360	විදුලි උපාංග	2,303,525	1,383,087
G 1501-1557	විදුලි උත්පාදන යන්ත්‍ර උපාංග	126,105	98,873
H 2501-2612	ගෘහපාලන අයිතම	451,619	236,906
L 1001-1107	විදුලි සෝපාන අමතර කොටස්	-	801,453
M 4601-4629	විවිධ අයිතම	93,500	3,230
N 4200-4289	ඇන සහ මුරිච්චි	67,917	74,496
O 4501-4518	ලිහිසි තෙල් අයිතම	607,242	20,508
P 3400-3675	පයිප්ප සහ සවිකිරීම්	596,726	446,059
S 3001-3194	ලිපිද්‍රව්‍ය අයිතම	1,080,791	719,875
T 4001-4192	ඉංජිනේරු අයිතම (තාක්ෂණික)	630,534	488,100
W 0501-0607	ජල නල අමතර කොටස්	198,119	198,610
X 4300-4344	පිත්තල ස්කුරුප්පු ඇණ	43,214	27,377
Y 4401- 4477	තීන්ත	579,223	470,210
2022 දෙසැම්බර් 31 දිනට මුළු තොග		**8,816,544**	**7,219,591**

සටහන් අංක 03
(අ) ලැබිය යුතු - උපයෝගී සඳහා තැන්පතු

ලෙජර් ගිණුම	සේවා සැපයුම්කරුගේ නම	විස්තරය	2021 වර්ෂය	2022 වර්ෂය
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	කාර්ය මණ්ඩල නිල නිවාස (161/31)	650.00	650.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	කාර්ය මණ්ඩල නිල නිවාස (161/31ඒ)	650.00	650.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	කාර්ය මණ්ඩල නිල නිවාස (161/34)	650.00	650.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	ආරච්චි නිල නිවාස	250.00	250.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	තනි පුද්ගල නිල නිවාස	3,500.00	3,500.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	විනිසුරු නිල නිවාස	13,500.00	13,500.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	අධිකරණ සංකීර්ණ ගොඩනැගිලි	5,678,750.00	5,678,750.00
විදුලි බිල් - තැන්පතු	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	බීසීසී වැඩබිම	392,000.00	392,000.00
ජල බිල් - තැන්පතු	ජල සම්පාදන සහ ජල අපවහන මණ්ඩලය	ජල සැපයීම වෙනුවෙන්	300.00	300.00
ප්‍රවාහන (ඉන්ධන) - තැන්පතු	ස්ලිප්ටෝ ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ්	ඉන්ධන සැපයීම වෙනුවෙන්	50,000.00	50,000.00
දුරකථන බිල් - තැන්පතු	ශ්‍රී ලංකා ටෙලිකොම්	දුරකථන සම්බන්ධතා සැපයීම වෙනුවෙන්	5,000.00	5,000.00
නවාතැන් - තැන්පතු	එම්. එච්. ජමයිඩීන්	ආරක්ෂක කුටිය	1,350,000.00	-
			7,495,250.00	**6,145,250.00**

(ආ) ලැබිය යුතු - වෙළඳ ණයගැති සහ අනෙකුත්

අංකය	ලෙජර් ගිණුම	සේවාදායකයාගේ නම	විස්තරය	2022 වර්ෂය රු.	2021 වර්ෂය රු.
	වෙළඳ ණයගැති - ආරක්ෂක කාර්යන්				
	ආරක්ෂක සේවා සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම				
